කාර්යාලය
அலுவலகம் } +94 (0) 11 2439352
Office

ලේකම්
செயலாளர் } +94 (0) 11 2320252
Secretary

# වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
## துறைமுகங்கள், கப்பல்துறை மற்றும் விமான சேவைகள் அமைச்சு
## Ministry of Ports, Shipping and Aviation

ෆැක්ස්
தொலைநகல் } +94 (0) 11 2435134
Fax No

විද්‍යුත් තැපැල
மின் அஞ்சல் } secretary@portmin.gov.lk
E-mail

මගේ අංකය / எனது இல / My Number } MPS/P&D/ 02/04/08 Vol. ii
ඔබේ අංකය / உமது இல / Your Number }
දිනය / திகதி / Date } 2022.11.29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත්සභා ප්‍රධාන ලේකම්වරුන්

**<u>සීමාසහිත ලංකා නැව් සංස්ථාව මගින් නැව් භාණ්ඩ ආනයනය සහ අපනයනය කිරීම</u>**

සීමාසහිත ලංකා නැව් සංස්ථාව ශ්‍රී ලංකාවේ ජාතික නැව් සේවය ලෙසින් වෙළඳ නාවික ක්ෂේත්‍රයේ වසර 50 කට අධික සේවා පළපුරුද්දක් ඇති පූර්ණ රාජ්‍ය සමාගමකි. වර්තමානය වන විට සීමාසහිත ලංකා නැව් සංස්ථාව තම ව්‍යාපාර කටයුතු පුළුල් කරමින් රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට ද සිය සේවා තරඟකාරී මිල ගණන් යටතේ සපයමින් සිටී.

02. ඒ අනුව සීමාසහිත ලංකා නැව් සංස්ථාව පහත දැක්වෙන සැපයුම් වලට (Logistics) අදාළ සියලුම සේවාවන් පිරිවැය ඵලදායීව මෙන්ම නියමිත වේලාවට සැපයීම සිදු කරමින් සිටී.

I. ලොව ඕනෑම ස්ථානයක සිට තවත් නියම කරනු ලබන ඕනෑම ස්ථානයකට භාණ්ඩ ප්‍රවාහන සේවාවන්
II. භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා වන ලිපි ලේඛන සකස් කිරීමේ සේවාවන්
III. ආනයන හා අපනයන සම්බන්ධ රේගු නිෂ්කාශන සේවාවන්
IV. නැව් භාණ්ඩ රක්ෂණ සේවාවන්
V. ආනයනය කරනු ලබන භාණ්ඩ අවසාන ගමනාන්තය දක්වා ප්‍රවාහනය හා ඒ හා බැඳුණු සේවාවන්

03. රාජ්‍ය ආයතනවල භාණ්ඩ ආනයනය කිරීමේ කාර්යය සීමාසහිත ලංකා නැව් සංස්ථාව මගින් ඉටුකරවා ගැනීම සම්බන්ධයෙන් වන 2005.05.06 දිනැති අංක 415 සහ 2016.02.18 දිනැති අංක 03 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. (අදාළ චක්‍රලේඛ වල පිටපත් ඇමුණුම 01 හා ඇමුණුම 02 හි දැක්වේ). 2016.02.18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03 හි 01 ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ ආනයනය කිරීමේදී 2005.05.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 415 හි විධිවිධාන තරයේ අනුගමනය කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණද සමහර රාජ්‍ය ආයතන ඊට පටහැනිව කටයුතු කරන බව නිරීක්ෂණය වේ.

එය රජයේ චක්‍රලේඛ වලට පටහැනිව කටයුතු කිරීමක් පමණක්ම නොවන අතර රට තුළින් විදේශ මුදල් ගලායෑමක් මෙන්ම, රටටත්, රාජ්‍ය ආයතන වලටත් ලැබිය යුතු ප්‍රතිලාභ නොලැබී යාමේ තත්ත්වයකට ද හේතු වේ.

04. එබැවින්, ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කොට, ඔබ යටතේ ඇති සියලුම ආයතන වලට භාණ්ඩ ආනයනය කිරීමේදී 2005.05.06 දිනැති අංක 415 හා 2016.02.18

අංක 19, චෛත්‍ය පාර
කොළඹ 01, ශ්‍රී ලංකාව

19, சைத்திய வீதி
கொழும்பு 01, இலங்கை

No. 19, Chaithya Road
Colombo 01. Sri Lanka

දිනැති අංක 03 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ වල විධිවිධාන අනුව කටයුතු කළ යුතු බවට අවධාරණය කරමින් උපදෙස් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

එසේම, තරඟකාරී මිලගණන් යටතේ නැව් සංස්ථාව විසින් සපයන විවිධ සේවාවන්, ඔබ යටතේ ඇති සියලුම ආයතන වලට දැනගැනීමට සැලැස්වීම මගින්, රටේ මුදල් රට තුළම රඳවා ගැනීමට හැකිවීමෙන් රටෙහි දැනට පවතින අහිතකර ආර්ථික තත්ත්වය සමනය කිරීමට සහ ජාතික නාවික ප්‍රවාහකයා ලෙස සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් ඉටුකරන ප්‍රයත්නයට ඔබ දක්වන දායකත්වයක් වන බව සිහිපත් කිරීමට කැමැත්තෙමි.

05. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිලධාරීන් විමසීම් මැනව..

| නිලධාරියාගේ නම | දුරකථන අංකය | ජංගම දුරකථන අංකය | විද්‍යුත් තැපැල |
|---|---|---|---|
| සභාපති | 011 232 9903 | 070 689 8023 | chairman@cscl.lk |
| සාමාන්‍යාධිකාරී | 011 232 4873<br>011 232 8997 | 071 446 8356 | gm@cscl.lk |
| සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) | 011 232 5744 | 071 0215 708 | niroshana@cscl.lk |

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර
ලේකම්

පිටපත් : 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, මුදල් , ආර්ථික ස්ථායීකරන හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති